Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව
## සති පාසල

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 9

දෙසැම්බර් මාසය - 1 සතිය

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති
ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය

### පුනරීක්ෂණ අභ්‍යාස -1

(1)

i. කාෆි රාගයට අදාළ විස්තර ඇතුළත් කර පහත දක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| රාගය | ආරෝහණ | අවරෝහණ | වාදී | සංවාදී | ජාතිය | ගානසමය | මුඛ්‍යාංගය | ස්වර සංගති | විශේෂ තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාෆි | | | | | | | | | |

ii. ස ස රි රි/ ග ග ම ම/- - - -/ප ධ නි සˆ මෙම ගී පාදය කාෆි රාගයේ සර්ගම් ගීයේ ආරම්භක පාදයයි. එහි තෙවන විභාගයට අදාළ වන ස්වර කොටස ලියන්න.

iii. සරිස, සරිගරිස.....මෙම ස්වර අභ්‍යාසය කාෆි රාගයට අනුව උච්ච සප්තකය දක්වා ගොඩනගන්න.

iv. කාෆි රාගයට අයත් මධ්‍යලය ගීතයේ ස්ථායි /අන්තරා කොටස් නියමිත තාල සංඥා සහිත ව ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(2) ජන ගී තනු ආශ්‍රිත ව නිර්මාණය වූ සරල ගී රැසක් වේ. ඒ අතරින් ඔබට නිර්දේශිත ගීත කිහිපයකට අදාළ වන තොරතුරු පහත දක්වා ඇත. වරහන් තුළ ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා පහත දක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

(උකුසා වන්නම/නන්දා මාලනී මහත්මිය/නීලා වික්‍රමසිංහ/රබන් පද හා තොවිල් කවි /රෝහණ බැද්දගේ මහතා)

| ගීතය | ගායකයා /ගායිකාව | පාදක වූ ජන ගායනා අංගය |
|---|---|---|
| දෑතට වළලු | ------------------- | නෙළුම් ගී |
| වන්නම් සවුදම් ගායන | ලයනල් රන්වල සූරීන් | ඇඹුම් කවි |
| මල්සරා බැල්ම හෙලා | -------------------- | --------- |
| රෑක් අත්තන මල මුදුනේ | ------------------- | --------- |

(3). i. පහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරලා ලියන්න. එහිදී ප්‍රස්තාරයට අදාළ වන කාලය හඟවන සංකේතය (**Time signature**) යොදන්න.




ii. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයෙහි නොමැති **Bass clef, Semibreve, Minim Rest, Flat mark,Key Signature** යන අපරදිග ස්වර සංකේත දළ රූපසටහන් මගින් ඇඳ දක්වන්න.

(4). පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. වන්නම්

ii. නූර්ති ගී

iii. සර්පිනාවේ ව්‍යුහය

iv. අනුවාදී ස්වර